8th International Conference of Multidisciplinary Approaches (iCMA), 2021
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka.
ISSN: 2386 – 1509
Copyright © iCMA


# සිංහල ග්‍රාමනාමකරණයේ සුසමාදර්ශය විතැන් වීම පිළිබඳ කොළොන්න කෝරළය පදනම් කරගත් අධ්‍යයනයක්

ලංකාමුල්ල කේ.එල්.* සහ විරංග ජී.ඒ.එච්.

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
klankamulla@sjp.ac.lk

**සාරසංක්ෂේපය**

සිංහල ග්‍රාමනාමකරණයේ සුසමාදර්ශ විතැන් වීම පිළිබඳ මෙම පර්යේෂණයේ අරමුණ සිංහල ග්‍රාමනාමකරණයේ සංස්කෘතික විකාසනය තෝමස් කුන්ගේ සුසමාදර්ශ විතැන් වීම සංකල්පයේ ආභාසය ලබා විශ්ලේෂණය කිරීම ය. එම සංකල්පය මානවශාස්ත්‍ර අධ්‍යයනයට දායක කරගැනීමේ තාර්කික සම්බන්ධය වන්නේ සියවස් ගණනාවක පිළිගැනීම වෙනස් වීම යන සාධකය මත ය. සුසමාදර්ශ විතැන් වීම යනු එක් දැනුම් ක්ෂේත්‍රයක පවත්නා දැනුම් ධාරාවක් විශාල කාල පරාසයකට පසු ව දැඩි වෙනසකට ලක් වීම යි. පර්යේෂණ සීමාව ලෙස කොළොන්න කෝරළය තෝරාගන්නා ලද්දේ ගම්මාන 123ක නියෝජනයකින් ය. සිංහල ග්‍රාමනාමකරණයේ සුසමාදර්ශය විතැන් වීම යනු මෙරට ග්‍රාමනාමකරණය සංස්කෘතික ක්‍රියාවලියක සිට අසංස්කෘතික ක්‍රියාවලියක් වෙතට පසුබැසීම ය. එය සමාජ ස්වාභාවිකත්වය මත පදනම් වීම වඩාත් සංස්කෘතික වූ ක්‍රියාවලිය යි. නූතනයේ ග්‍රාම නාමකරණය කිරීම හිතුවක්කාරී ලෙස සිදු වෙයි. සමාජයේ සංස්කෘතික ස්වාභාවිකත්වය කෘත්‍රිම ව වෙනස් කිරීමක් වෙතට පොළා පැන තිබේ. මෙම නව නාමකරණ ක්‍රියාවලිය සමාජ අවශ්‍යතාව හේතුවෙන් කරන ලද්දක් නො වේ. කොළොන්න කෝරළයේ නාමකරණ ක්‍රියාවලිය විවිධ සමාජ ව්‍යාපාර මත වෙනස් වී තිබේ. සංස්කෘතික නාම යනු සමාජ වටිනාකමකි. එම වෙනස්කම සංක්‍රාන්තියක් හෝ පරිණාමයක් වශයෙන් සැලකිය නො හැකි ය. එය ග්‍රාම නාමකරණය විෂයෙහි දී සිදු වන්නේ ග්‍රාමනාමකරණය සංස්කෘතික වශයෙන් දුර්වල තත්ත්වයකට පත් කරවමිනි. අතීත ග්‍රාමනාමකරණය දීර්ඝ කාලීන සංස්කෘතික ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගුණි. විදේශීය අසංස්කෘතික නාමකරණ බලපෑම් හා දේශීය දේශපාලන ව්‍යාපෘතිවල බලපෑම් මත කොළොන්න කෝරළයේ ග්‍රාමනාම විවිධ විපර්යාසයන්ට ලක් වී තිබේ. මෙම පර්යේෂණ නියැදියේ ප්‍රතිඵල ද මත ලංකාවේ විශාල වශයෙන් මෙම තත්ත්වය නිරීක්ෂණය වන බව පැහැදිලි විය. කොළොන්න කෝරළයේ සාම්ප්‍රදායික සංස්කෘතිකාර්ථ නො සලකා හරිමින් ගොඩනගන ලද ග්‍රාමනාම නවයක් දක්නට තිබේ. එනම් වෙස්ටන් වත්ත, ජී.ජී. කොටස, ලෝර්ඩේල් වත්ත, නන්දනගම, ඇබපොයිල් වතු යාය, හේයස්වත්ත, ලෝන්ෆෝඩ් වත්ත, සාම ගම්මානය, යන නාමකරණයන් ය. එම අසංස්කෘතික නාමකරණ ග්‍රාම නාමකරණය සඳහා මෙතෙක් බල පැවැත්වූ සංස්කෘතික ක්‍රියාවලියෙන් විතැන් වී තිබේ. එය ග්‍රාමනාමකරණයේ සුසමාදර්ශ විතැන් වීම යනුවෙන් මෙම පර්යේෂණයෙන් නිගමනය වේ.

**ප්‍රමුඛ පදඃ** *සුසමාදර්ශ විතැන් වීම, ග්‍රාමනාමකරණය, කොළොන්න කෝරළය, අසංස්කෘතික නාමකරණය*